# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1796/8 - 2013 පෙබරවාරි මස 06 වැනි බදාදා - 2013.02.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3(2) වැනි උප වගන්තිය යටතේ නිවේදනය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (2) වැනි උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය, ලක්ෂ්මන් යාපා අබේවර්ධන වන මා විසින් උසස් අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා මෙම නිවේදනය මගින් -

(1) සෙන්ට්‍රල් ලැන්කෂයර් විශ්ව විද්‍යාලයට අනුබද්ධිත විශ්ව විද්‍යාල ශාඛාවක්, බස්නාහිර පළාතේ, මීරිගම අපනයන සැකසුම් කලාපයේ පිහිටුවීම සඳහා, වර්ෂ 2012 ක්වූ දෙසැම්බර් මස 13 වැනි දින යුක්ලැන් ලංකා පුද්ගලික සමාගම හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර ව්‍යාපෘති ගිවිසුමකට එළඹෙන ලද බවත්, ඇමරිකානු ඩොලර් මිලියන සියය (ඇ. ඩො. 100,000,000) ක පමණ මුළු ආයෝජනයකින් යුත් මෙම ව්‍යාපෘතිය, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ අන්තර්ගත ප්‍රතිපාදනයන්ට අනුකූලව, අදාල ව්‍යාපෘතිය, සමාගම විසින් එකී විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරකම් පවත්වාගෙන යායුතු බවත්, මෙම ව්‍යාපෘතිය ජාතික වැදගත්කමක් හිමි වන රටට ආර්ථික සහ සාමාජීය ප්‍රතිලාභ හිමිකර දෙන තුඩුදිය හැකි ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගෙන ඇති බවත් ප්‍රකාශ කරමි.

(2) ඉහත කී ව්‍යාපෘතියට අදාලව අක්කර එකසිය විස්ස (120) ක පමණ භූමි භාගයක් මීරිගම අපනයන පිරිසැකසුම් කලාපයෙන් වසර අනූ නමය (99) ක බද්දකට වර්ෂ 2012 දෙසැම්බර් මස 13 වැනි දින බදු ගිවිසුමක් මගින් ව්‍යාපෘති සමාගමට බදු දෙන ලද බවත්, ප්‍රකාශ කරනු ලැබේ.

(3) ඉහත කී ව්‍යාපෘතිය ආරම්භ විය යුතු දිනය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම වන යුක්ලැන් ලංකා පුද්ගලික සමාගම අතර එහි ව්‍යාපෘතිය ගිවිසුමකට ඇතුලත් වූ දිනය වන වර්ෂ 2012 ක් වූ දෙසැම්බර් මස 13 වැනි දිනය විය යුතු බවටත් අදියර (4) කින්, ව්‍යාපෘතිය ආරම්භ වන දිනයේ සිට වසර (10) කාලයක් තුළ මෙකී ව්‍යාපෘතිය සම්පූර්ණ කර යුතු බවටත්, ප්‍රකාශ කරනු ලැබේ.

(4) ඉහත කී ව්‍යාපෘතියේ කාර්යය සඳහා සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන පනත ප්‍රකාරව මෙහි උපලේඛනයේ දක්වා ඇති නිදහස් කිරීම් මෙම සමාගමට අදාල වන බවටද නිශ්චිතව දක්වනු ලැබේ.

උපලේඛනය

**(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

(i) බදු ගෙවිය යුතු ලාභය සමාගම උපයන මුල් වසරේ ආරම්භය සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර පහ (05) කට පසු, කලින් එළඹෙන කවර හෝ වසර සිට වසර (15) කට ආදායම් බදු පනත යටතේ සංස්ථාපිත ආදායම් බදු නිදහස් කාල පරිච්ඡේදයක්, ඉන්මතු නිදහස් කාල පරිච්ඡේදයේ අවසාන දිනයට අනතුරුව එළඹෙන වැඩිපුර ඉක්බිති වසර දහය (10) කට සෑම තක්සේරු වසරකටම සියයට විසි පහ (25%) ක සහනදායී බදු ප්‍රතිශතයක් හිමි වේ. පැහැදිලි කිරීමක් වශයෙන්, ඉහත විදහා පෙන්වා දී තිබෙන වසර විසි පහ (25) ඉකුත් වීමෙන් පසුව දේශීය ආදායම් පනතේ

විධිවිධාන යටතේ එවිට බල පවත්වන සාමාන්‍ය බදු රාමුව, ව්‍යාපෘති සමාගමේ ලාභය හා ආදායම් මත ආදායම් බදු ගෙවීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම කෙරෙහි අදාල වනු ඇත. ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගත් විදේශ ණය සඳහා ගෙවන පොළිය සහ ව්‍යාපෘතිය මගින් සේවයේ යොදවනු ලබන උපදේශකයන්ට ගෙවනු ලබන තාක්ෂණික ගාස්තු, කළමනාකරණ ගෙවීම්, පුරස්කාරක ගෙවීම් සහ අලෙවිකරණ ගෙවීම් රඳවා ගැනීමේ බදු ගැනීමෙන් සමාගම නිදහස් වේ.

(ii) ඉදින්, කළමනාකරණ ගාස්තුව දළ මෙහෙයුම් ආදායම් වලින් සියයට තුන (3%) ක ප්‍රමාණයක් / පුරස්කාරක වශයෙන් සිදුකරන ලද ගෙවීම්, අලෙවිකරණ ගෙවීම් දළ මෙහෙයුම් ආදායම්වලින් සියයට එකයි දශම පහ (1.5%) ක ප්‍රමාණයක් නොඉක්ම විය යුතුය.

(iii) එකී වසර පහළොවක (15) ක බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ සහ ඉන්මතු වසර එක (01) කට ලාභවලින් කොටස්කරුවන්ට බෙදා දෙනු ලබන ලාභාංශවලට ආදායම් බදු නිදහස ලැබේ.

(iv) සමාගමේ උපරිම ප්‍රවාසික සේවකයින් සංඛ්‍යාව විස්ස (20) කට වසර පහ (05) ක කාලයකට උපයන විට ගෙවිය යුතු බදු නිදහස අදාලවනු ඇත.

**(ආ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත**

ගිවිසගත් දිනයේ සිට ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලය වූ අවුරුදු දහය (10) ක කාලය ඇතුළත ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ආනයනය කිරීම සහ ව්‍යාපෘතියට අදාල දේශීය වශයෙන් මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවාවන් මෙන්ම ව්‍යාපෘති සමාගම අනුමත උප කොන්ත්‍රාත්කරුවන් සඳහා වන ගෙවීම්ද ඇතුළුව, එකතු කළ අගය මත බදු ගෙවීම් විලම්බනය කරනු ලැබේ.

**(ඇ) 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධනය අයකිරීම් පනත**

ව්‍යාපෘතිය ගිවිසගත් දිනයේ සිට ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලය වූ අවුරුදු දහය (10) ක කාලය තුළ සහ ව්‍යාපෘතිය මගින් ආනයනය කරනු ලබන සියලුම අයිතමන් සඳහා (ව්‍යාපෘති සමාගම විසින් සෘජුවම ආනයනය කළද/අනුමත කරන ලද කොන්ත්‍රාත්කරුවන් මගින් ආනයනය කළද) මෙකී බද්ද අදාළ නොවනු ඇත.

**(ඈ) 2005 අංක 5 දරන මුදල් පනත**

ව්‍යාපෘතිය ගිවිසගත් දිනයේ සිට ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලය වූ අවුරුදු (10) ක කාලය තුළ, ව්‍යාපෘති සමාගමට හෝ උප කොන්ත්‍රාත්කරුට ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් අයකිරීම් සහ ගෙවීම් අදාල නොවනු ඇත.

**(ඉ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු බද්ද**

බදු නිදහස් කාල පරිච්ඡේදය අවසානය දක්වා අදාළ නොවනු ඇත.

**(ඊ) 1953 අංක 24 දරන විනිමය පාලන පනත**

විනිමය පාලන පනතේ I, IA, II, III, IV, V සහ VI දරන ප්‍රතිපාදන ව්‍යාපෘති සමාගමට අදාල නොවේ.

**(උ) (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනත**

ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් වලට පමණක් ව්‍යාපෘති සමාගම නමින් ආනයනය කරනු ලබන අයිතමයන් /දේශීය වෙළඳපොළෙන් මිලදී ගතහැකි ව්‍යාපෘතියට අදාළ අයිතමයන් සහ ද්‍රව්‍ය රේගු බදු අයකිරීම් වලින් නිදහස් වේ.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන, පා.ම.
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

02 - 706

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.